# १३ त्रयोदशः पाठः ।

# वयं मिलित्वा वाक्यानि रचयामः ।

## (वाक्यनिर्माणपरिचयः । ०१)

පුහුණුවට

| | | | |
|---|---|---|---|
| अद्य | - අද | प्रातः | - උදෑසන |
| प्रत्यूषे | - අලුයම | चन्द्रवारे/ सोमवारे | - සඳුදා |
| एकवादने | - 1.00 ට | सपादसप्तवादने | - 7.15 ට |
| सार्धपञ्चवादने | - 5.30 ට | पूर्वमाघे/ उत्तरपौषे | - ජනවාරි මාසේ |

**13.1 පහත සඳහන් නාමපදයන්හි බහුවචන රූප ලියන්න.**

गृहगोधिका > ............. उलूकः > ............. गृहपतिः> ............. सारमेयः > ............. धेनुः
चित्रलः > ............. चषकः > ............. चमसः > ............. उपधानम् > ............. चित्रम्
कविः > ............. बन्धुः > ............. भ्राता > ............. माता > ............. देवी
रज्जुः > ............. सरोवरः > ............. त्यागः > ............. शास्त्रं > .............धनिकः

**13.2 සුදුසු ක්‍රියාපද යොදා හිස්තැන් පුරවන්න.**

| | | | |
|---|---|---|---|
| मुनी | - ........................................ | गुरवः | - ........................................ |
| आचार्याः | - ........................................ | सा | - ........................................ |
| ते | - ........................................ | ताः | - ........................................ |
| दासः | - ........................................ | माता | - ........................................ |
| बालिके | - ........................................ | खगाः | - ........................................ |

**13.3 පහත සඳහන් වාක්‍ය ද්විවචනයට හරවන්න.**

| | | | |
|---|---|---|---|
| हंसः कूजति । | - ................................ | मनुष्यः व्रजति । | - ................................ |
| कविः रचयति । | - ................................ | बालिका नृत्यति । | - ................................ |
| चोरः चोरयति । | - ................................ | नटः प्रविशति । | - ................................ |
| साधुः भाषति । | - ................................ | सारमेयः भषति । | - ................................ |
| अश्वः चरति । | - ................................ | सारथिः नयति । | - ................................ |

## 13.4 පහත සඳහන් වාක්‍ය සංස්කෘතයට පරිවර්තනය කරන්න.

1. නිහඬ ව ඉන්න.
2. උදෑසන 7.30ට එහෙ යන්න.
3. අලුයම අවදිවෙන්න.
4. සඳුදා නොවරදවා ම එන්න.
5. ජනවාරි මාසේ එහෙ යන්න එපා.
6. එහෙ මෙහෙ ඇවිදින්න එපා.
7. හෙමින් කන්න.
8. ඇත්ත කියන්න. බොරු කියන්න එපා.
9. කවදාවත් අමතක කරන්න එපා.
10. ඉක්මණින් ලිපියක් එවන්න.

## 13.5 පහත සඳහන් වාක්‍ය ප්‍රථමපුරුෂයට හරවන්න.

| | | | |
|---|---|---|---|
| अहम् आगच्छामि । | - ...................... | आवां नयावः । | - ...................... |
| वयं नृत्यामः । | - ...................... | अहं न चोरयामि । | - ...................... |
| वयं लिखामः । | - ...................... | आवां न रक्षावः । | - ...................... |
| अहम् इच्छामि । | - ...................... | वयं तुष्यामः । | - ...................... |
| आवां कृन्तावः । | - ...................... | अहं क्षालयामि । | - ...................... |

## 13.6 පහත සඳහන් ක්‍රියාපද ඒකවචනයට හරවන්න.

| | | | |
|---|---|---|---|
| क्षाम्यन्ति । | - ...................... | भ्राम्यथः । | - ...................... |
| मुञ्चथ । | - ...................... | क्षिपन्ति । | - ...................... |
| वर्णयामः । | - ...................... | रचयावः । | - ....................... |
| भूषयामः । | - ...................... | भक्षयन्ति । | - ...................... |
| स्पृशथः । | - ...................... | दीव्यामः । | - ...................... |



सा चलनचित्रं पश्यति ।　　　　अहं सेवाफलं खादामि ।

मार्जारः मत्स्यं चोरयति ।　　　　पिता कार्यालयं गच्छति ।

මෙම වාක්‍යයන්හි **चलनचित्रं - सेवाफलं - मत्स्यं - कार्यालयं** යන පද කර්මපදයෝ වෙති. ඒවා ද්විතීයා විභක්තියෙන් තබා ඇත. ප්‍රධාන වශයෙන් කර්තෘකාරක වාක්‍යයක කර්මපදය තනනු ලබන්නේ ද්විතීයා විභක්ත්‍යනුකූල ව ය. ඉහත පළමු වාක්‍යයෙහි තේරුම **'ඇය චිත්‍රපටියක් නරඹයි'**. යන්නයි. **'මම ඇපල් ගෙඩියක් කමි'**, **'පූසා මාළුවෙකු සොරකම් කරයි'**. යනු දෙවන හා තෙවන වාක්‍යයන්හි අර්ථ වේ. ඒ වාක්‍යයන්හි කර්මපදය එක හා සමාන ලෙස යෙදී ඇත. එහෙත් සිව්වෙනි වාක්‍යයෙහි තේරුම **'තාත්තා කාර්යාලයට යයි'** වේ. **චිත්‍රපටියක්, ඇපල් ගෙඩියක්, මාළුවෙකු** යන කර්මපදයන්ට වඩා **'කාර්යාලයට'** යන වචනය වෙනස් වේ. ඒ අනුව ක්‍රියාව විඳින්නා පමණක් නොව, ගමනාර්ථයෙහි ද ද්විතීයා විභක්තිය භාවිත වේ.

උදා:-

गुरवः विद्यालयं गच्छन्ति ।

वैद्यमहोदयः चिकित्सालयं गच्छति ।

मुनी आश्रमं प्रविशतः ।

13.7 පහත වගුව ඇසුරෙන් සුදුසු පද තෝරා අර්ථවත් වාක්‍ය නිර්මාණය කරන්න.

| | | |
|---|---|---|
| सः - सा - कवी - कन्ये - मातरौ - तौ - मार्जाराः - कवयः - अश्वः | पयोहिमं - जम्बीरफलं - पायासं - पुस्तकं - पुष्पाणि - कपोतान् - धर्मं - धनं - उपहारं - गुरून् - फलानि तृणं | यच्छति । खादति । पचतः । पश्यतः । चोरयन्ति । यच्छतः । खादन्ति । चरति । रचयतः । |

13.8 පහත වාක්‍ය සංස්කෘතයට පරිවර්තනය කරන්න.

01. ඔවුහු පන්සලට යති.

02. මුනිවරු අසපුවලට යති.

03. ගුරුවරු දෙදෙනා පුස්තකාලයට පිවිසෙත්.

04. ගැහැණු ළමයි වැවට බසිති.

05. කුමාරිකාවෝ උයනට යති.

06. ඔබ පාසලට යහි ද?

07. අම්මා පොළට යයි.

08. ගොවියෝ කුඹුරුවලට යති.

09. කුරුල්ලෝ කැදලි කරා පියාඹති.

10. අපි කඩේට යමු.

13.9 පහත සඳහන් වාක්‍ය අතීතකාලයට හරවන්න.

०१. त्वं कुत्र गच्छसि ?

०२. वयं क्षीरं पिबामः।

०३. ते पुस्तकं पठन्ति।

०४. मातरः शिशून् रक्षन्ति।

०५. बालिके गीतं गायतः।

०६. युवां कुत्र वसथः?

०७. तौ किं मन्त्रयतः?

०८. कृषीवलौ वृषभौ ताडयतः।

०९. अहं संस्कृतं लिखामि।

१०. कवयः चन्द्रं वर्णयन्ति।



කර්මකාරක වාක්‍යයක ප්‍රධාන වනුයේ කර්මපදය යි. ප්‍රධාන කර්මය ප්‍රථමා විභක්තියෙන් තැබේ. මෙබඳු වාක්‍යයන්හි කර්තෘපදය තබන්නේ තෘතීයා හෙවත් තුන්වන විභක්තියෙනි.

### 3.1 තෘතියා විභක්තිය කර්මකාරක වාක්‍යයන්හි කර්තෘපදය ලෙස යෙදීම.

උදා:-

| | |
|---|---|
| **पुत्र्या** दूरदर्शनं दृश्यते । | **දුව විසින්** රූපවාහිනිය නරඹනු ලැබේ. |
| **पित्रा** वार्तापत्रिका पठ्यते । | **තාත්තා විසින්** පුවත්පත කියවනු ලැබේ. |
| **मात्रा** पायासं पच्यते । | **අම්මා විසින්** කිරිබත උයනු ලැබේ. |

### 3.1.1 විසින් - යනාර්ථය ද තෘතීයා විභක්තියෙන් සූචනය කෙරේ.

| | | |
|---|---|---|
| ගොවියා විසින් | - | कृषिकेन |
| වඳුරා විසින් | - | कपिना |
| නෑයා විසින් | - | बन्धुना |
| අම්මා විසින් | - | मात्रा |

**13.10 සුදුසු රූප යොදා හිස්තැන් පුරවන්න.**

| | | |
|---|---|---|
| ०१. ........................................ | पुस्तकः रच्यते । | (ලේඛකයා විසින්) |
| ०२. ........................................ | पुत्रः नीयते । | (තාත්තා විසින්) |
| ०३. ........................................ | बीजानि उप्यन्ते । | (ගොවියන් විසින්) |
| ०४. ........................................ | श्लोकः पठ्यते । | (ඇය විසින්) |
| ०५. ........................................ | भारः उह्यते । | (සේවකයන් දෙදෙනා විසින්) |
| ०६. ........................................ | कदलीफले खाद्येते । | (වඳුරන් විසින්) |

०७. ........................................ पञ्चालिका दीयते। (අම්මා විසින්)

०८. ........................................ मृगः मार्यते। (සිංහයා විසින්)

०९. ........................................ धनं चुर्यते। (සොරුන් විසින්)

१०. ........................................ जालं कृन्त्यते। (මීයන් දෙදෙනා විසින්)

3.2 **सह - सार्धं - समं - साकं** (සමග) යන නිපාත සමග යෙදෙන නාමපදයන් ද තෘතීයා විභක්තියෙන් තැබේ.

| | | | |
|---|---|---|---|
| ගොවියා සමග | - | कृषिकेन | सह |
| වඳුරා සමග | - | कपिना | |
| නෑයා සමග | - | बन्धुना | |
| අම්මා සමග | - | मात्रा | |

13.11 පහත සඳහන් වාක්‍යයන් **सह - सार्धं - समं - साकं** නිපාතය සමග ලියන්න.

01. ඔහු ඇය සමග පාසල් යයි.
02. අම්මා තාත්තා සමග බයිසිකලයෙන් පොළට ගියා ය.
03. ඔබ මා සමග එහෙ යහි ද?
04. නුඹලා ඊයේ ඔවුන් සමග පාඩම් කළෙහු.
05. මුනිවරු පඬිවරුන් සමග ධර්මය සාකච්ඡා කළහ.
06. ශිව දෙවිඳු උමාව සමග හිමාලයට ගියේ ය.
07. මුවෝ මුවදෙනුන් සමග වනයෙහි හැසිරෙති.
08. මීමැස්සා මීමැස්සිය සමග මල් පැණි බොයි.
09. රජතුමා ඇමැතිවරුන් දෙදෙනා සමග පිටරට ගියේ ය.
10. ගුරුවරුන් දෙදෙනා ළමයින් සමග චාරිකාව යත්.

3.3 යම් කිසිවක උපකාරයෙන් යමක් කරයි ද එය ද ප්‍රකාශ කරනුයේ ද තෘතීයා විභක්තියෙනි.

शिक्षकः **सुधाखण्डेन** लिखति। ගුරුවරයා හුණුකැල්ලෙන් ලියයි.

13.12 පහත වාක්‍ය සිංහලට නගන්න.

०१. कृषिकः हलेन कर्षति।

०२. जनाः पुष्पैः बुद्धं पूजयन्ति।

०३. सा छुरिकया शाकं कर्तयति।

०४. पुरुषः पादाभ्यां चलति।

०५. उपासकाः हस्ताभ्यां प्रणमन्ति।

०६. चटकाः चञ्चुभिः भक्षयन्ति।

०७. माता घट्याः समयं जानाति।

०८. नराः विमानेन विदेशं गच्छन्ति।

०९. छात्रः द्विचक्रेन पाठालयं विशति।

१०. बालिका लेखन्या सुन्दराक्षराणि लिखति।

3.4 **विना** යෝගයේ ද තුන්වැනි විභක්තිය යෙදේ.

**विना** - හැර/තොරව

सूर्येण **विना** प्रकाशः न भवति।

13.13 පහත වාක්‍ය සිංහලට නගන්න. **विना** නිපාත යෝගය සහිත වාක්‍ය කිහිපයක් නිර්මාණය කරන්න.

०१. घटया विना समयं ज्ञातुं न शक्नोति।

०२. गृहं बालकैः विना न शोभते।

०३. धर्मं विना मित्रं नास्ति।

०४. विना आश्रया न शोभन्ते वनिताः।

०५. वयं नेत्राभ्यां विना द्रष्टुं न शक्नुमः।

०६. जलेन विना पुष्पाणि म्लायन्ते।

०७. बालकः मात्रा विना न गच्छति।

०८. वयं तैः विना न जीवामः।

०९. भोजनं लवणं विना रुचिकरं न भवति।

१०. सभा पण्डितः विना न शोभते।



परोपकारः **पुण्याय पापाय** परपीडनम्।

චතුර්ථී විභක්තිය සම්ප්‍රදානාර්ථයෙහි යෙදේ.

උදා-:

| | |
|---|---|
| **मात्रे** शाटिकां ददाति। | අම්මාට සාරියක් දෙයි. |
| **स्वस्रे** पञ्चालिकां यच्छति। | නංගීට බෝනික්කෙක් දෙයි. |

ඒ හැරුණු විට සඳහා, පිණිස යනාර්ථයන්හි ද සිව්වන විභක්තිය යෙදේ.

උදා-: बालकाः **ज्ञानाय** विद्यालयं गच्छन्ति।

මෙහි ළමයි පාසලට යනු ලබන්නේ දැනුම ලබාගැනීම සඳහා ය. ඒ නිසා **ज्ञानाय** යන පදය සිව්වන විභක්තියෙන් තබා ඇත.

13.14 පහත වගුව ඇසුරෙන් වාක්‍ය 10ක් නිර්මාණය කරන්න.

| | | |
|---|---|---|
| अग्रजः - अनुजः - स्वसा माता - पिता | मोक्षाय | धर्मे सञ्चरति। |
| याचकः - व्याघ्रः - भिक्षुः | आहाराय<br>गोचराय<br>पिण्डाय | नगरं<br>वनं } प्रविशति।<br>ग्रामं |

**13.15 පහත සඳහන් වාක්‍ය සංස්කෘතයට පරිවර්තනය කරන්න.**

01. අපි විනෝදය පිණිස සතුන් නොමරමු.
02. සැප පිණිස ධර්මයෙහි හැසිරෙන්න.
03. ගැහැණු ළමයි නෑම සඳහා වැවට යති.
04. රජතුමා යුද පිණිස යුද්ධභූමියට පිවිසෙයි.
05. ඔවුහු රට උදෙසා දිවි පූජා කළ හ.
06. ඈ ඉගෙනීම සඳහා මුදල් වියදම් කළා ය.
07. මම මෝක්ෂය පිණිස කුසල් පුරමි.
08. දෙමව්පියෝ දරුවන්ගේ සැප පිණිස දුක් විඳිති.
09. ගුරුවරු සතුට සඳහා උගන්වති.
10. මුනිවරු දුකින් මිදීම සඳහා වෙර දරති.

1.3 **नमः - स्वस्ति** නිපාතයන් ද චතුර්ථී විභක්ති පද සමග යෙදේ. **නමස්කාර වේවා. සෙත්වේවා** යනු එම නිපාතයන්හි අර්ථ වේ.

बुद्धाय
देवाय
ब्रह्माय
मात्रे
पित्रे
} नमः

ते
मह्यम्
एतस्मै
एतस्यै
सर्वस्मै
} स्वस्ति

**13.16 ඉහත වගුව ඇසුරෙන් වාක්‍ය 10ක් නිර්මාණය කර ඒවා සිංහලට නගන්න.**



पादपानां भयं वातात् पद्मानां शिशिराद् भयम्।
पर्वतानां भयं वज्रात् साधूनां दुर्जनाद् भयम्।

යමකින් හෝ යම් කෙනෙකුගෙන් යමෙක් හෝ යම් දෙයක් වෙන් වේ නම් ඒ වෙන්වීමට සීමා වූ වස්තුව අපාදාන නම් වේ. ඒ අපාදානාර්ථයෙහි පඤ්චමී විභක්තිය යෙදේ. මේ අපාදානය දෙවැදෑරුම් වේ.

**01. චලාපාදානය** **02. අචලාපාදානය** වශයෙනි.

ස්ථාවර නොවන දෙයකින් වෙන් වේ නම් එය චලාපාදාන නම් වේ. අචලාපාදාන යනු ස්ථාවර දෙයකින් සිදුවන වෙන්වීමයි.

උදා-: दुर्जनाद् भयम्।
आचार्याद् ज्ञानं लभते। යන වාක්‍ය චලාපාදානයට නිදසුන් වේ.

पद्मानां शिशिराद् भयम्।
पर्वताद् नदी प्रवहति। යන වාක්‍යය අචලාපාදානයට නිදසුන් වේ.

13.17 (අ) වගුව ඇසුරෙන් වාක්‍ය නිර්මාණය කරන්න.
(ආ) එම වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.

<table>
<tr><td>पितामहः - पितामही<br>खगः - सिंहः - नौका</td><td colspan="2">गृहात्<br>नीडात् - गुहायाः - कूलात्</td><td>निष्क्रमति।</td></tr>
<tr><td>गुरवः - छात्राः<br>पितरः - सेवकाः</td><td colspan="2">विद्यालयात्<br>कार्यालयात्</td><td>प्रत्यागच्छन्ति।</td></tr>
<tr><td>नद्यः - निर्झराः</td><td colspan="2">पर्वतात् - पर्वतेभ्यः</td><td>प्रवहन्ति।</td></tr>
<tr><td>अहं - आवां -वयं<br>त्वं -युवं - यूयं</td><td>ग्रामात्</td><td>नगरं<br>प्रवासं<br>वनं</td><td>प्रति गच्छामि। गच्छावः।<br>गच्छामः।<br>प्रति गच्छसि। गच्छथः।<br>गच्छथ।</td></tr>
</table>



ස්වාමී අර්ථයෙහි හයවෙනි විභක්තිය යෙදේ. එනම් යම් දෙයක අයිතිය අඟවන නාමපදය ෂෂ්ඨී විභක්තියෙන් තැබිය යුතු වේ.

**दुहिता भर्तुः गृहं गच्छति। माता दुहितुः शिशुं लालयति। शिशवः मातृणां गानेन तुष्यन्ति। पत्नी पत्युः आज्ञाम् अनुसरति। पुत्रः पितुः आज्ञया जामातुः गृहात् स्वसारम् आनयति। वयं शकटस्य शब्दम् आकर्णयामः। यूयं धेनोः क्षीरं पिबथ।**

*බාලාදර්ශේ නවමඃ පාඨඃ।*

13.18 (අ) මෙහි වර්ණිත පදයන්හි අර්ථය ලියන්න.
(ආ) එහි ඒකවචනයෙන් යෙදී ඇති පදයන් බහුවචනය හරවන්න.
(ඇ) උද්ධෘතයෙහි සරල අදහස ලියන්න.

3.2 **नभसो भूषणं चन्द्रो नारीणां भूषणं पतिः।**
**पृथिव्या भूषणं राजा विद्या सर्वस्य भूषणम्॥**

(අ) මේ ශ්ලෝකයෙහි යෙදී ඇති වාක්‍ය ලියන්න.
(ආ) ඒවායෙහි සිංහල අදහස ලියන්න.
(ඇ) ෂෂ්ඨී විභක්තිගත පද උපුටා දක්වන්න.

13.19 පහත සඳහන් වාක්‍යය සංස්කෘතයට නගන්න.

01. මේ අපේ දේශයයි.
02. ඔහුගේ දේශනයට සවන්දෙන්න.
03. සිසුන්ගේ තරඟ අද පැවැත් වේ.
04. හිරුගේ රැසින් මල් පිපේ.
05. මුනිවරුන්ගේ අනුශාසනා අනුගමනය කරමු.
06. එහෙ ගැහැණු ළමයින්ගේ පාසල ඇත.
07. අපේ මව් බස සිංහල වේ.
08. ඔබගේ නැගණියගේ නම මොකක් ද?
09. ඔබේ මිතුරාගේ පන්තිය කොහෙ ද?
10. කිරිඅත්තාගේ කතාව මිහිරි ය.



स्वगृहे पूज्यते मूर्खः स्वग्रामे पूज्यते प्रभुः ।
स्वदेशे पूज्यते राजा विद्वान् सर्वत्र पूज्यते ॥

හත්වන විභක්තිය ආධාරාර්ථයෙහි යෙදේ. කර්තෘ හා කර්මය දරන්නා ආධාර නම් වේ.

काकः शाखायाम् उपविशति । स दिवा आकाशे डयते नक्तं नीडे वसति । भेकाः वापीषु वसन्ति । ते वर्षासु रटन्ति । भेकः भूमौ प्लवते । लतासु कुसुमानि विकसन्ति । वयं तरुषु फलानि पश्यामः । समुद्रे रत्नानि जायन्ते । नराः भूमौ वसन्ति । देवाः स्वर्गे तिष्ठन्ति ।

*बालदर्शे दशमः पाठः ।*

4.1 යම් දෙයක හෝ යම් කෙනෙකු දරා සිටින ස්ථානය හැඟවීම

| | | |
|---|---|---|
| मनुष्यः / देवः / भिक्षुः भूपतिः / गृहपतिः / मुनिः / गुरुः / शुकः / मत्स्यः | कुत्र | वसति ? |
| | लोके - स्वर्गे- विहारे- प्रासादे - गृहे - आश्रमे - पाठालये - नीडे - जले | |

උදා-ः

खगः कुत्र वसति ? खगः नीडे वसति ।

13.20 (අ) උදාහරණයට අනුව ඉහත වගුව ඇසුරෙන් වාක්‍ය 10ක් නිර්මාණය කරන්න.
(ආ) පහත වගුව ඇසුරෙන් ද වාක්‍යය තනා ඒවා සිංහලට පරිවර්තනය කරන්න.

| | | | |
|---|---|---|---|
| देवः / भिक्षुः / भूपतिः गृहपतिः / मुनिः / गुरुः / शुकः | कुत्र | | वसति ? |
| | एकस्मिन् तस्मिन् | स्वर्गे- विहारे- प्रासादे - गृहे - आश्रमे - पाठालये - नीडे | |

4.2. කාලාර්ථයෙහි ද හත්වන විභක්තිය යෙදේ.

| | | | |
|---|---|---|---|
| त्वं कदा तत्र गच्छसि ? | अहं | एकवादने<br>सार्धसप्तवादने<br>सपादाष्टवादने<br>पञ्चोन द्वादशवादने<br>अस्मिन् सप्ताहे<br>अद्य प्रत्यूषे<br>अस्मिन् बुधवारे<br>रविवारे | गच्छामि । |

උදා-: त्वं कदा तत्र गच्छसि ? ඔබ එහෙ යන්නේ කීයට ද?
अहं सार्धसप्तवादने गच्छामि । මම එහේ 7.30ට යමි.

13.21 ඉහත වගුව ඇසුරෙන් වාක්‍ය නිර්මාණය කරන්න.

अङ्गीकृतं सुकृतिनः परिपालयन्ति ।

යහපත් අය තමා පිළිගත් දෙය රැකගනිත්.

अचिन्त्यं हि फलं सूते सद्यः सुकृतपादपः ।

යහපත් වෘක්ෂයෝ නොසිතිය හැකි තරම් ඵල ලබාදෙයි.

अतिभुक्तिरतीवोक्तिः सद्यः प्राणापहारिणी ।

අධික කෑමත් අධික කථාවත් ඉක්මනින් මරණය ළඟාකරයි.